සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: චිත්‍ර | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 01 |

• ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

පහත දැක්වෙන කලා කෘතිය හඳුනාගෙන ඒ ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු හිස්තැන් මත ලියන්න.



ඉහත රූපයෙන් දැක්වෙන්නේ ① .................................. යුගයේ සිටි චිත්‍ර ශිල්පියෙකු වූ ② ....................................මහතාගේ ③ ........................................................ නම් වූ චිත්‍රයයි. මෙම චිත්‍රය සඳහා ④ ........................................ ආභාසය ලැබී ඇති බව චිත්‍රය නිරීක්ෂණය කිරීමේ දී පෙනී යන අතර මෙම චිත්‍රය ⑤ ............................................ ක්‍රමයට මුද්‍රණය කර ඇත.

ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා අසා ඇති ප්‍රශ්න වල නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය වරහන තුළ ඇති තිත් ඉර මත ලියන්න.

6. ගම්පල යුගයේ ඉදිකර ඇති ලංකාතිලක විහාරයේ නිර්මාණ ශිල්පියා වනුයේ,
   1. දේවරගම්පල සිල්වත් තැන ය.
   2. ස්ථපතිරායර ය.
   3. දෙල්මඩ මූලාචාර්ය ය.
   4. දේවේන්ද්‍ර මූලාචාර්ය ය. (...............)

7. "යහපත් සමරිතානුවා" යනුවෙන් නම් කර ඇති මහනුවර ත්‍රිත්ව දෙව මැදුරේ දක්නට ඇති චිත්‍රය නිර්මාණය කරනු ලැබුවේ,
   1. එම්. සාර්ලිස් විසිනි.
   2. ජෝර්ජ් කීට් විසිනි.
   3. ඩේවිඩ් පේන්ටර් විසිනි.
   4. සෝලියස් මෙන්ඩිස් විසිනි.

(...............)

8. මැදවල විහාරය අයත් වන්නේ,

1. ගිංජිකාවසත සහිත විහාර ගණයට ය.
2. පේසා මත ඉදි කළ විහාර ගණයට ය.
3. ලෙන් හාරා සකස් කළ විහාර ගණයට ය.
4. ටැම්පිට විහාර ගණයට ය. (...............)

9. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ හමුව ඇති සුදු හුණු ගලින් නිර්මාණය කළ විශේෂ මූර්තිය වනුයේ,


1. නිරුවත් පිරිමි කවන්ධ රුව ය.
2. නළඟන රුව ය.
3. පූජක රුව ය.
4. මවු දෙවඟන රුව ය. (...............)

10. මිසර ශිෂ්ටාචාරයෙන් හමු වූ සුවිශේෂී නිර්මාණයක් වූ පිරමීඩ ඉදිරිපිට යොදා ඇති සුවිසල් මූර්තිය හඳුන්වන්නේ,


1. ස්ක්‍රයිබ් යනුවෙනි.
2. ස්පින්ක්ස් යනුවෙනි.
3. හේසීරා යනුවෙනි.
4. නෙෆර්ටිටි යනුවෙනි. (...............)

- අංක 11 සිට 15 දක්වා දී ඇති රූපසටහන් වලට ගැලපෙන රූපය A,B,C,D,E යන රූප සටහන් වලින් තෝරා එයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය චිත්‍රය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

11.  (...............)

 A

12.  (...............)


 B

13.  (...............)

 C

14.  (...............)

 D

15.  (...............)

 E

- අංක 16 සිට 20 දක්වා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

16. යුරෝපීය ජාතික චිත්‍ර ශිල්පියෙකු වන රෆායල් විසින් "ස්ටෙන්සා ඩෙලා සිග්නැචුරා" ශාලාවේ ඇඳ ඇති දාර්ශනිකයින් පිරිසක් විවාදයක පැටලී සිටින ආකාරය දැක්වෙන චිත්‍රය කුමක් ද?..............................

..............................................................................................................................

17. ඉසුරුමුණි පෙම් යුවල කැටයමෙහි දක්නට ලැබෙන උසස් නිමාව හා භාව ප්‍රකාශනය අනුව මෙම කැටයමට බලපා ඇති ඉන්දීය කලා සම්ප්‍රදාය කුමක් ද? ..............................................................

18. මහනුවර යුගයේ පාරම්පරික චිත්‍ර ශිල්පීන් නිල් වර්ණය සාදාගෙන ඇත්තේ කුමන පැලෑටියකින් ද? .....

..............................................................................................................................



19. මිසර චිත්‍රවල පසුබිමට යොදා ඇති අක්ෂර විශේෂය හඳුන්වන්නේ කුමන නමකින් ද? ........................

..............................................................................................................................

20. යුරෝපීය ප්‍රාග් ඓතිහාසික ලෙන් චිත්‍ර අතර ඇති අඩි 17 ක් දිගින් යුතු ගව රූපය හමුවන ප්‍රංශයේ පිහිටා ඇති ලෙන කුමක්ද?

..............................................................................................................

- අංක 21 සිට 25 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේ දී පහත දැක්වෙන F,G,H,I,J යන රූප සටහන් උපයෝගී කර ගන්න. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

| F | G | H | I | J |
|---|---|---|---|---|
|  |  |  |  |  |

21. යුරෝපා කලාවේ දැකිය හැකි පැරණි සංස්කෘතියකින් හමු වූ කිරිගරුඬ මූර්තියක් වූ "ඇතීනා දෙවඟනගේ මූර්තිය F අක්ෂරයෙන් දැක්වේ. එය නිර්මාණය කළ ශිල්පියා වන්නේ,
    1. පිඩියස් ය.
    2. ස්කෝපස් ය.
    3. මයිරන් ය.
    4. ඇන්ටිසෝච් ය.

22. දෙනෙත් විවෘතව බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීම ගම්පල යුගයේ දැකිය හැකි විය. G රූපයෙන් දැක්වෙන්නේ,
    1. ලංකාතිලක බුද්ධ ප්‍රතිමාවයි.
    2. ගඩලාදෙණි බුද්ධ ප්‍රතිමාවයි.
    3. මහඉලුප්පල්ලම බුද්ධ ප්‍රතිමාවයි.
    4. ගල් විහාර සමාධි බුද්ධ ප්‍රතිමාවයි.

23. පුනරුද යුගය ප්‍රභාමත් කළ ශිල්පියෙකුගේ විශිෂ්ට කෘතියක් H අක්ෂරයෙන් දැක්වේ. එය හඳුන්වන්නේ,

1. මව සහ දරුවා ලෙස ය.
2. මව් සෙනෙහස ලෙස ය.
3. පියෙටා ලෙස ය.
4. රජ පවුල ලෙස ය.

24. යාපනයේ නල්ලූර් හි සට්ටනාදර් ශිව කෝවිලේ නිර්මාණය කර තිබූ සුදු කුකුළා නම් වූ චිත්‍ර නිර්මාණය I අක්ෂරයෙන් දක්වා ඇත. මෙම චිත්‍රය නිර්මාණය කළ ශිල්පියා වනුයේ,

1. පෙරියතම්බි සුබ්‍රමනියම්
2. තාවඩි මු තුරෙයිසාමි
3. රවි වර්මා
4. ඒ. මාර්ක්

25. ජීවියාගේ මැවීම, පැවැත්ම හා විනාශය නිරූපණය කෙරෙන ලෝකඩ මූර්තියක් J අක්ෂරයෙන් දැක්වේ. මෙම ලෝකඩ මූර්තිය හමුව ඇත්තේ,

1. අනුරාධපුර යුගයෙනි.
2. පොළොන්නරු යුගයෙනි.
3. මහනුවර යුගයෙනි.
4. ගම්පල යුගයෙනි.

- අංක 26 සිට 30 දක්වා දී ඇති ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචනය යොදා හිස්තැන් පුරවන්න.

26. තෙත බදාමය මත චිත්‍රය ඇඳීමේ ශිල්ප ක්‍රමය ................................................යනුවෙන් හැඳින්වේ.

27. "සංකස්සපුර තිණිමං දර්ශනය" සහ "දේවාරාධනාව" යන චිත්‍ර නිර්මාණය කර ඇත්තේ පොළොන්නරුවේ ................................................................................ තුළ ය.

28. අඳුර තුළින් ආලෝකය වඩාත් තීව්‍ර ලෙස මතු කර දැක්වීම ලියනාඩෝ ඩාවින්චි චිත්‍ර ශිල්පියාගේ චිත්‍ර වල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයකි. මෙම වර්ණ ගැන්වීමේ ක්‍රමය ................................................ නමින් හැඳින්වේ.

29. ඉන්දීය ................................................ කලා සම්ප්‍රදායට අයත් විශිෂ්ට කලා කෘතියක් ලෙස සිද්ධාර්ථ බෝසතාණන්ගේ දුෂ්කර ක්‍රියාව දැක්වෙන පිළිමය හැඳින්විය හැකිය.

30. සන කැපීම, ලකුණු කැපීම ආදී ශිල්ප ක්‍රම භාවිතයට ගැනෙනුයේ පාරම්පරික ජන කලාවක් වූ ................................................................ කර්මාන්තය සඳහා ය.

- අංක 31 සිට 35 දක්වා දී ඇති වචන වල අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය බැගින් ලියන්න.

31. පාර්ශවදර්ශී - ................................................................................
................................................................................


32. සිරස්පත - ................................................................................
................................................................................

38. ත්‍රිභංග - ................................................................................
................................................................................

34. නියද කෙඳි - ................................................................................
................................................................................

35. පශුපති - ................................................................................
................................................................................

• පහත දැක්වෙන කලා නිර්මාණය හඳුනාගෙන අංක 36 සිට 40 දක්වා අසා ඇති සියලු ම ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු සපයන්න.



36. මෙය ............................................................................................ යුගයට අයත් පිළිමයකි.

37. මෙම ප්‍රතිමාව ගල් විහාරය හෙවත් ............................................................ තුළ දැක ගත හැකි වේ.

38. මෙම පිළිමයේ චීවරයේ රැළි සමාන්තර රේඛා ............................................. බැගින් යොදා ඇත.

39. මෙම පිළිමය තුළින් ............................................................................ මුද්‍රාව නිරූපනය වේ.

40. මෙම ස්ථානයේ පවතින සියලු ම බුදු පිළිම සඳහා ඉන්දීය ................................................ කලා සම්ප්‍රදාය බල පා ඇති බැව් විචාරක මතයයි.

(ලකුණු 1 × 40 = 40 යි)



5708

5708

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: චිත්‍ර | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 02 |

- නිදහස් රේඛාමය ඇඳීම සහ වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය
- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට,

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න.

- මෙම චිත්‍ර දෙක ම එකට අමුණා ශාලාධිපතිට භාර දෙන්න.
- ඔබේ චිත්‍රය ඇඳීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

රේඛා අධ්‍යයනය

1. පූර්ව අධ්‍යයනයේ දී දක්වන කුසලතා

වර්ණ චිත්‍රය

2. ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මකව සම්පිණ්ඩනය වීම.
3. පරිමාණය, පර්යාලෝක රීති හා ත්‍රිමාන ලක්ෂණ පිළිබඳ අවබෝධය.
4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය සහ ගති ලක්ෂණ දැක්වීම.
5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතාව.
6. උචිත පසුබිමක් යෙදීම සහ සමස්ත නිමාව.

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැලපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

(ලකුණු 30 යි)

570ජ

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: චිත්‍ර | පත්‍රය / வினாத்தாள் / Paper: III | පැය / மணித்தியாலம் / Hours: 02 |

★සැලකිය යුතුයි.

- ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.
- ඔබේ විභාග අංකය හා ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසුපිටේ ලියන්න.
- උත්තර පත්‍රය ශාලාධිපතිට භාරදීමට පෙර වියළී තිබිය යුතුය.
- ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැකි අතර පෙල්ට් පෑන් භාවිතය සුදුසු නැත.
- "අ" හෝ "ආ" හෝ "ඉ" කොටස් තුනෙන් එක් කොටසක් පමණක් තෝරාගන්න.

"අ" කොටස - ප්‍රකාශන චිත්‍ර

01. ගොඩනැගිල්ලක් ඉදිකරන වැඩ බිමක වැඩෙහි යෙදී සිටින කම්කරුවන් පිරිසක්
02. බෞද්ධ, හින්දු, ඉස්ලාම් හෝ ක්‍රිස්තියානි ආගමික ස්ථානයක ආගමික වතාවත් වල යෙදී සිටින බැතිමතුන්
03. නාගරික පරිසරයක පිහිටි සති පොළක කළබලකාරී අවස්ථාවක්
04. ගංගාවක දිය නාන අලි රංචුවක්

"ආ" කොටස - මෝස්තර නිර්මාණය

05. ස්වභාවිකව දක්නට ලැබෙන මලක් සහ කොළයක් තෝරාගෙන එය නිර්මාණාත්මකව වෙනස් කර වීත්ත රෙද්දකට හෝ දොර රෙද්දකට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.
06. සතෙකුගේ සරළ හැඩයක් භාවිත කරමින් පුටුවක තබන කොට්ටයකට සුදුසු මුළුතල මෝස්තරයක් නිර්මාණය කරන්න.
07. නිවසේ අලංකාරයට තැබිය හැකි මැටි බඳුනක් සැලසුම් කර නූතන සැරසිලි යොදා අලංකාර කරන්න.
08. සම්ප්‍රදායික සැරසිලි මෝස්තර යොදා ගනිමින් වෘත්තාකාර බන්දේසියක් සැලසුම් කර වර්ණ කරන්න.

"ඉ" කොටස - ග්‍රැෆික් චිත්‍ර

09. පාසලේ පැවැත්වීමට නියමිත විවිධ ප්‍රසංගය ප්‍රචාරය කිරීමට සුදුසු පෝස්ටර් චිත්‍රයක් නිර්මාණය කරන්න. (ප්‍රමාණය අඟල් 7 x 10)
10. "ඩෙංගු උවදුර පිටුදකිමු" යන මැයෙන් පෝස්ටරයක් සැලසුම් කර වර්ණ කරන්න. (ප්‍රමාණය අඟල් 7 x 10)
11. "පැරණි බිතු සිතුවම්" යන තේමාව යටතේ රචිත පොතක් සඳහා පොත් පිට කවරයක් සැලසුම් කර වර්ණ කරන්න. (ප්‍රමාණය අඟල් 7 x 9)
12. සත්ත්ව හා තුරුලතා හැඩ යොදා ගනිමින් බිත්ති සැරසිල්ලක් නිර්මාණය කරන්න. (ප්‍රමාණය අඟල් 8 x 5)